## පරමාර්ථ ධර්ම

අභිධර්ම පිටකයේ අන්තර්ගත වන්නේ පරමාර්ථ ධර්මයෝය. පරමාර්ථ ධර්මයෝ යනු තවදුරටත් බෙදාදැක්විය නොහැකි ධර්මතා සමූහයකි. එවා කොටස් වශයෙන් 4කි. එනම්- * චිත්ත * චෛතසික * රූප * නිබ්බාන යන මේ ධර්මයෝය.

සත්‍ය-

ලෝකයේ සත්‍ය වර්ග දෙකක් ඇත. එනම් - * සම්මුති සත්‍ය * පරමාර්ථ සත්‍ය

| සම්මුති සත්‍ය | පරමාර්ථ සතය (පරම + අත්ථ) |
|---|---|
| යම් යම් හේතු අනුව පනවාගත් හෙවත් සම්මත කරගත් ඒවාය.<br><br>ඒනිසා ඒවා පඤ්ඤත්ති ධර්ම ලෙසද දැක්වේ.<br><br>නිතර ව්‍යවහාරයේ පවතී.<br><br>ජීවී අජීවී සත්ව පුද්ගල සියල්ල ඇතුලත්ය.<br><br>ඒවා සැබෑම සත්‍යයෝ නොවෙති. | ස්වභාව ලක්ෂණ අනුව සම්පූර්ණයෙන්ම සම්මුතියෙන් වෙනස්ය.<br><br>තවත් බෙද දැක්වීමට නොහැකි කුඩාම ස්වභාවයයි.<br><br>ජීවී අජීවී සියල්ල ගොඩනැගී ඇති මුලික ස්වභාවයයි.<br><br>මේවා සම්මුති සත්‍ය තුල සැගවී ඇත. සැගවී ඇත්තේ අවිජ්ජාව හෙවත් මොහය නිසාය.<br><br>ප්‍රඥාව දියුණු කිරීමෙන් මේවා ප්‍රකට කරගත හැකිය.<br><br>නිදසුන- සත්වයා *(සම්මුතිය)*.......නුවනින් විමසිමෙන් *(විපස්සනා)*.....නාම+රූප පඤ්චස්කන්ධ *(පරමාර්ථ* ලෙස ප්‍රකටකර ගතහැකිය.<br><br>පරමාර්ථ සත්‍යය සැගව ඇත්තේ ඇයි ?<br><br>ප්‍රඥාව මඳ බව/ පුහුණු කිරීම මඳබව/ සම්මුතියෙන් සිත රවටා තිබීම /අයෝනිසො මනසිකාරය |